MULTI FINANCE

# මල්ටි ෆිනෑන්ස් පීඑල්සී

## මූල්‍ය ප්‍රකාශන 2022 මාර්තු 31න් අවසන් වූ වර්ෂය සඳහා

### විස්තීරණ ආදායම් ප්‍රකාශය

| මාර්තු 31න් අවසන් වූ වර්ෂය සඳහා (විගණනය කළ) | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| **ආදායම** | **120,357,181** | 134,104,126 |
| පොලී ආදායම | **111,453,969** | 126,590,478 |
| පොලී වියදම | **(25,200,657)** | (42,830,661) |
| **ශුද්ධ පොලී ආදායම** | **86,253,312** | 83,759,817 |
| ගාස්තු සහ කොමිස් ආදායම | **720,468** | 735,079 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | **8,182,744** | 6,778,569 |
| **මුළු මෙහෙයුම් ආදායම්** | **95,156,524** | 91,273,465 |
| ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණය | **(155,667,981)** | (3,872,222) |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | **(60,511,457)** | 87,401,243 |
| **මෙහෙයුම් වියදම** | | |
| කාර්ය මණ්ඩල වියදම් | **(75,797,743)** | (81,745,361) |
| දේපල, පිරියත හා උපකරණ ක්ෂයකිරීම | **(23,863,969)** | (24,761,207) |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | **(615,074)** | (976,921) |
| වෙනත් මෙහෙයුම් වියදම් | **(38,707,890)** | (39,908,955) |
| **මුළු මෙහෙයුම් වියදම්** | **(138,984,676)** | (147,392,444) |
| **මූල්‍ය සේවා මත බදු පෙර මෙහෙයුම් අලාභ** | **(199,496,133)** | (59,991,201) |
| මූල්‍ය සේවා මත බදු | **(7,214)** | (2,902,110) |
| **බදු පෙර අලාභය** | **(199,503,347)** | (62,893,311) |
| ආදායම් බදු වියදම | **-** | (19,706,223) |
| **කාලසීමාව සඳහා අලාභය** | **(199,503,347)** | (82,599,534) |
| **ආදායම් ප්‍රකාශනයට නැවත වර්ගීකරණය කරනු ලබන අනෙකුත් විස්තරාත්මක ආදායම** | | |
| ලාභය හෝ අලාභයට අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගය නැවත වර්ගීකරණය | **(50,308)** | (207,437) |
| අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයේදී මනින ලද මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස/(අලාභය) | **-** | 10,546 |
| අඩුකලා: ඉහත අයිතම මත විලම්භිත බදු අයකිරීම/(ආපසු හැරවීම) | | |
| **ආදායම් ප්‍රකාශනයට නැවත වර්ගීකරණය කරනු ලබන අනෙකුත් ශුද්ධ විස්තරාත්මක ආදායම** | **(50,308)** | (196,891) |
| **ආදායම් ප්‍රකාශනයට නැවත වර්ගීකරණය කරනු නොලබන අනෙකුත් විස්තරාත්මක ආදායම** | | |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභ/(අලාභ) | **4,512,590** | (660,791) |
| අඩුකලා: ආයුගණක ලාභ සහ අලාභ මත විලම්භිත බදු අයකිරීම/(ආපසු හැරවීම) | **-** | 158,590 |
| **නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ශුද්ධ ආයුගණක ලාභ/(අලාභ)** | **4,512,590** | (502,201) |
| **ආදායම් ප්‍රකාශනයට නැවත වර්ගීකරණය කරනු නොලබන අනෙකුත් ශුද්ධ විස්තරාත්මක ආදායම** | **4,512,590** | (502,201) |
| **වසර සඳහා බදු අඩුකළ අනෙකුත් විස්තරාත්මක ආදායම** | **4,462,282** | (699,092) |
| **වසර සඳහා බදු අඩුකළ මුළු විස්තරාත්මක ආදායම** | **(195,041,065)** | (83,298,626) |
| **කොටසකට ඉපයීම්/(අලාභය) මූලික/තනුක (රු.)** | **(3.14)** | (1.30) |

වරහන් තුල සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.

### මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| මාර්තු 31 දිනට (විගණනය කළ) | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| **වත්කම්** | | |
| මුදල් හා මුදලට සමාන දෑ | **13,693,690** | 23,195,923 |
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ ලැබීම් | **254,667,027** | 411,421,218 |
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ලැබියයුතු කල්බදු වාරික සහ කුලී තොගය | **82,196,194** | 158,110,929 |
| වෙනත් විස්තරාත්මක ආදායම් තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් | **2,500** | 535,489 |
| වෙනත් මූල්‍ය වත්කම් | **135,469,843** | 119,229,696 |
| වෙනත් මූල්‍ය නොවන වත්කම් | **37,534,569** | 40,072,409 |
| නැවත අයිතිකරගත් තොගය | **-** | 4,090,270 |
| ලැබියයුතු ආදායම් බදු | **5,227,631** | 5,227,631 |
| ආයෝජන දේපල | **71,150,000** | 68,333,000 |
| විලම්භිත බදු වත්කම් | **-** | - |
| දේපල, පිරියත හා උපකරණ සහ භාවිතයට අයිතිය ඇති වත්කම් | **16,576,715** | 39,401,866 |
| අස්පෘශ්‍ය වත්කම් | **1,007,511** | 524,860 |
| **මුළු වත්කම්** | **617,525,680** | 870,143,291 |
| **වගකීම්** | | |
| බැංකුවලට ගෙවියයුතු | **3,208,335** | 3,128,745 |
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - තැන්පතුකරුවන්ට ගෙවියයුතු | **253,824,754** | 294,272,187 |
| වෙනත් මූල්‍ය වගකීම් | **37,025,793** | 53,490,242 |
| වෙනත් මූල්‍ය නොවන වගකීම් | **17,796,298** | 16,897,718 |
| පශ්චාත් රැකියා ප්‍රතිලාභ වගකීම | **6,859,576** | 8,502,410 |
| **මුළු වගකීම්** | **318,714,756** | 376,291,302 |
| **ස්කන්ධ ප්‍රාග්ධනය** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | **898,375,289** | 898,375,289 |
| සංචිත | **16,655,272** | 16,705,580 |
| රඳවාගත් ඉපයීම් / (සමුච්චිත අලාභ) | **(616,219,637)** | (421,228,880) |
| **මුළු ස්කන්ධ ප්‍රාග්ධනය** | **298,810,924** | 493,851,989 |
| **මුළු වගකීම් සහ ස්කන්ධ ප්‍රාග්ධනය** | **617,525,680** | 870,143,291 |
| **කොටසක ශුද්ධ වත්කම් අගය (රු.)** | **4.70** | 7.76 |

වරහන් තුල සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.

### තෝරාගත් ප්‍රධාන කාර්ය සාධන දර්ශක

| අයිතමය | 2022 මාර්තු 31 දිනට | | 2021 මාර්තු 31 දිනට | |
|---|---|---|---|---|
| **නියාමන ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය (%)** | **තථ්‍ය** | **අවශ්‍ය** | **තථ්‍ය** | **අවශ්‍ය** |
| 1 වන ස්ථරයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය | 67.61 | 7.00 | 53.18 | 6.50 |
| මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය | 67.61 | 11.00 | 53.18 | 10.50 |
| අරමුදල් ප්‍රාග්ධනයට තැන්පතු වගකීම් අනුපාතය | 116.68 | 10.00 | 163.74 | 10.00 |
| **ණය කලඹේ ගුණාත්මකතාවය (%)** | | | | |
| දළ අක්‍රීය ණය අනුපාතය | 53.03 | | 45.29 | |
| ශුද්ධ අක්‍රීය ණය අනුපාතය | 3.41 | | 15.58 | |
| ශුද්ධ අක්‍රීය ණයට මූලික ප්‍රාග්ධන අනුපාතය | 7.86 | | 24.22 | |
| වෙන් කිරීම් ආවරණ අනුපාතය | 77.10 | | 48.74 | |
| **ලාභදායිත්වය (%)** | | | | |
| ශුද්ධ පොලී ආන්තිකය | 10.13 | | 8.26 | |
| වත්කම් මත ප්‍රතිලාභ | -32.31 | | -7.23 | |
| හිමිකම් මත ප්‍රතිලාභ | -66.77 | | -16.73 | |
| ආදායම් මත පිරිවැය අනුපාතය | 146.06 | | 161.48 | |
| **ද්‍රවශීලතාවය (%)** | | | | |
| පවතින ද්‍රවශීල වත්කම්වලට ද්‍රවශීල වත්කම් අවශ්‍යතා අනුපාතය (අවම 100%) | 451.38 | | 586.57 | |
| ද්‍රවශීල වත්කම් වලට බාහිර අරමුදල් අනුපාතය | 44.99 | | 35.23 | |
| **නාමික තොරතුරු** | | | | |
| ශාඛා ගණන | 7 | | 7 | |
| බාහිර ණය ශ්‍රේණිය | [SL] C+(Negative) (ICRA) | | [SL] C+ (ICRA) | |
| **නියාමන අධිකාරියක් විසින් පසුගිය මාස 6 තුල පනවා ඇති දඩ** | - | | - | |
| ප්‍රමාණය (රුපියල් මිලියන) | | | | |
| **නියාමන තැන්පතු සීමා පැනවීම්** | | | | |
| මුළු තැන්පතු සඳහා උපරිම සීමාව (රු. මිලියන) | 600 | | 600 | |
| අඩු කළ යුතු තැන්හපතු ප්‍රමාණය-මසකට (රුපියල් මිලියන) | 25 | | 25 | |
| තැන්පතු අත්හිටුවීම් | - | | - | |
| **නියාමන ණය ගැනීම් සීමා පැනවීම්** | | | | |
| ණය ගැනීම් සඳහා උපරිම සීමාව (රුපියල් මිලියන) | - | | - | |
| ණය ප්‍රමාණය අඩු කිරීම-මසකට/කාර්තුවකට/වසරකට (රුපියල් මිලියන) | - | | - | |
| ණය ගැනීම් අත්හිටුවීම් | - | | - | |
| **නියාමන ණයදීම් සීමා පැනවීම්** | | | | |
| මුළු ණය කලඹ සඳහා උපරිම සීමාව (රුපියල් මිලියන) | 1300 | | 1300 | |
| අඩු කරන ලද ණය කලඹේ ප්‍රමාණය - මසකට (රුපියල් මිලියන) | 50 | | 50 | |
| නව ණය ප්‍රදානය සහ/හෝ පවත්නා ණය පහසුකම් වල කොන්දේසි දීර්ඝ කිරීම අත්හිටුවීම | - | | - | |
| **වෙනත් නියාමන සීමා කිරීම්** | N/A | | N/A | |

**සහතික කිරීම :**

මල්ටි ෆිනෑන්ස් පී.එල්.සී හි අධ්‍යක්ෂවරු සහ මූල්‍ය කළමනාකරු වන අප විසින් සාමූහිකව පහතින් සහතික කර ඇති පරිදි,

(අ) ඉහත ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති ආකෘතියට හා අර්ථ දැක්වීම් වලට අනුකූලව සකස් කර ඇත;

(ආ) බලපත්‍රලාභී මුදල් සමාගම විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශනවල අන්තර්ගත තොරතුරු විගණනය කළ තොරතුරු මිස විගණනය නොකළ තොරතුරු අන්තර්ගත නොවන බව සලකන්න.

| (අත්සන් කළේ) | (අත්සන් කළේ) | (අත්සන් කළේ) |
|---|---|---|
| **නිරෝෂන් උඩගේ** | **රවීන්ද්‍ර යටවර** | **නුවන් එදිරිවීර** |
| අධ්‍යක්ෂක | අධ්‍යක්ෂක | මූල්‍ය කළමනාකරු |
| 2022 ජූනි 30 | 2022 ජූනි 30 | 2022 ජූනි 30 |

**2011 අංක 42 මුදල් ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකාවේ මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර ලබාදී ඇත.**

**මෙම භාෂා අතර යම් අනුකූලතාවයක් (වෙනසක්) ඇති වුවහොත් ඉංග්‍රීසි බසින් පලකළ වාර්තාව බලපැවැත්වේ.**
**කේ පී එම් ජී විගණන ආයතනය විසින් 2021/22 වර්ෂය සඳහා නිකුත් කරන ලද විගණන වාර්තාවේ සිංගල පරිවර්තනය පහත දැක්වේ.**

KPMG


KPMG
(Chartered Accountants)
32A, Sir Mohamed Macan Markar Mawatha,
P. O. Box 186,
Colombo 00300, Sri Lanka.

Tel : +94 - 11 542 6426
Fax : +94 - 11 244 5872
+94 - 11 244 6058
Internet : www.kpmg.com/lk


### ස්වාධීන විගණක වාර්තාව

**මල්ටි ෆිනෑන්ස් පීඑල්සීහි කොටස්හිමියන් වෙත**

**මුදල් ප්‍රකාශන පිළිබඳ විගණන වාර්තාව**

**මතය**

2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් විස්තරාත්මක තොරතුරුවලින් සමන්විත සටහන් ඇතුළත් මල්ටි ෆිනෑන්ස් පීඑල්සී හි (සමාගම) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපි විගණනය සිදු කළෙමු.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවත් සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල බවත් අපගේ මතය වේ.

**මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව අපි විගණනය කළෙමු. මෙම විගණන ප්‍රමිති යටතේ වූ අපගේ වගකීම්, අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයට (Code of Ethics) අනුකූලව අපි සමාගමෙන් ස්වාධීන වන අතර ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව අපි අපගේ වෙනත් සදාචාර වගකීම් ඉටු කර ඇත. අපගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා අප විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව අපගේ විශ්වාසයයි.

**අඛණ්ඩතාව සම්බන්ධයෙන් වැදගත් අවිනිශ්චිතතාව**

සමාගම 2017 අංක 02 දරන අවම ප්‍රධාන ප්‍රාග්ධන නියෝගය සමඟ අනුකූල වී නොමැති බව සඳහන් කරන මූල්‍ය ප්‍රකාශවලට සටහන් 45 කෙරෙහි අපි අවධානය යොමු කරමු. තවද, සමාගම වසර කිහිපයක් පුරා අඛණ්ඩව අලාභ දරා ඇති අතර 2022 මාර්තු 31 දිනට එහි එකතුව රු. 616,219,637ක් විය.

ඊට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවම ප්‍රධාන ප්‍රාග්ධන අවශ්‍යතාවනට අදාළ නියාමන අවශ්‍යතාවන්ට අනුකූල වන තුරු සමාගමේ ණයදීම සහ තැන්පතු මෙහෙයුම් කෙරෙහි සීමා පනවා ඇත. ඉහත කරුණ සම්බන්ධයෙන් සමාගම ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සාකච්ඡාවක යෙදී සිටී.

ගිණුම්කරණය පිළිබඳ අඛණ්ඩ පැවැත්මේ පදනම යොදා ගැනීම පිණිස, සමාගම ශ්‍රී ලංකා මහ බැංකුවේ එකඟත්වය සමඟ නියාමන අවශ්‍යතා සපුරාලිය යුතුය.

එමනිසා, අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමාගමේ හැකියාවට බලපාන වැදගත් අවිනිශ්චිතතාව නියාමන අවශ්‍යතා මගින් දක්වා ඇති කොන්දේසි ආමන්ත්‍රණය කෙරෙහි රඳා පවතී. අපගේ මතය මෙම කරුණ සම්බන්ධයෙන් වෙනස් නොවේ.

**ප්‍රධාන විගණන කරුණු**

ප්‍රධාන විගණන කරුණු යනු, අපගේ වෘත්තීය විනිශ්චය අනුව, වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ අපගේ විගණනය තුළ වඩාත් වැදගත් වූ කරුණු වේ. සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ විගණන සන්දර්භය තුළ සහ ඒ පිළිබඳව අපගේ මතය සැකසීමේදී මෙම කරුණු ආමන්ත්‍රණය කරන ලද අතර, මෙම කරුණු පිළිබඳව අපි වෙනම මතයක් ඉදිරිපත් නොකරමු. අඛණ්ඩ පැවැත්ම කොටසට අදාළව වැදගත් අවිනිශ්චිතතාවල විස්තර කර ඇති කරුණට අමතරව, පහත විස්තර කර ඇති කරුණු අපගේ වාර්තාවේ සන්නිවේදනය කළ යුතු ප්‍රධාන විගණන කරුණු බවට අපි තීරණය කර ඇත.

**1. කල්බදු, ලැබියයුතු කුලිපිට මිලදී ගැනීම්, අත්තිකාරම් සහ වෙනත් ණය සඳහා හානිකරණ දීමනාව**

සටහන 4.2.10 (ගිණුම්කරණ ප්‍රතිපත්ති) සහ සටහන 20.1 හි විස්තර කරන පරිදි, සමාගම 2022 මාර්තු 31 දිනට රු. 351,884,581ක ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු, ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ලැබියයුතු කල්බදු වාරික සහ කුලී තොග සඳහා හානිකරණ වෙන්කිරීම තක්සේරු කර ඇත.

**අවදානම් විස්තරය**

සමාගම SLFRS 9 - මූල්‍ය උපකරණවලට (SLFRS 9) අනුකූලව හානිකරණ අලාභ සඳහා ගණනය කිරීම සඳහා අපේක්ෂිත ණය අලාභ (ECL) ආදර්ශය භාවිතා කරයි.

සංකීර්ණතාවයේ ඉහළ මට්ටම සහ විනිශ්චය අපේක්ෂිත ණය අලාභ තක්සේරු කිරීම හා සම්බන්ධ වේ. අලාභයේ අදියර හඳුනා ගැනීම, ඉදිරිය දකින පැහැරහැරීමේ සම්භාවිතාව (PD), අලාභ දෙන පැහැර හැරීම (LGD), අවශ්‍ය දත්ත යෙදවුම් භාවිතය පිළිබඳ බර තැබීම සහ විනිශ්චයන් ඇතුළුව සාර්ව ආර්ථික අවස්ථා ඇතුළුව අපේක්ෂිත ණය අලාභ ආදර්ශයට SLFRS 9 හි අවශ්‍යතා අදාළ කිරීමේදී සමාගම විසින් සිදු කරන ලද ප්‍රධාන උපකල්පන ගණනාවක් ද ඇත.

පවතින අවිනිශ්චිත සහ වෙනස්වන සාර්ව ආර්ථික පරිසරය සහ කොවිඩ්-19 වසංගතය මගින් ආර්ථික දැක්ම පිළිබඳ උපකල්පන වඩාත් අවිනිශ්චිත බව අදහස් වන අතර එය රජයේ විවිධ ප්‍රතිචාර සමඟ ඒකාබද්ධ, ECL සහ ආශ්‍රිත විගණන අවදානම ගණනය කිරීමේදී සමාගමට අවශ්‍ය විනිශ්චය මට්ටම වැඩි කරයි.

මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා ණය සහ ලැබිය යුතු වටිනාකම්, බදු සහ කුලීපිට මිලදී ගැනීම්වල ලැබිය යුතු ශේෂ, ECL දීමනා මැනීමට භාවිතා කරන සමාගමේ ECL ආදර්ශවල ආවේණික සංකීර්ණත්වය සහ SLFRS 7 මූල්‍ය උපකරණ: අනාවරණ අවශ්‍යතා මගින් දක්වා ඇති අවශ්‍ය හෙළිදරව් කිරීම්: හෙළිදරව් කිරීම් මට්ටමේ වැදගත්කම හේතුවෙන් ප්‍රධාන විගණන කරුණක් ලෙස අපේක්ෂිත ණය අලාභ සඳහා දීමනාව අපි හඳුනාගෙන ඇත.

අපගේ විගණන ක්‍රියාපටිපාටියට පහත දෑ ඇතුළත්ය.

- පවතින අවිනිශ්චිත සහ වෙනස්වන සාර්ව ආර්ථික පරිසරය විශේෂයෙන් සැලකිල්ලට ගනිමින් SLFRS 9 හි අවශ්‍යතාවලට අනුව හානිකරණ ආදර්ශය තුළ ආවේනික වූ ක්‍රමවේදය තක්සේරු කිරීම;
- අදියරකරණය, පැහැරහැරීමේ සම්භාවිතාව සහ අලාභ දෙන පැහැර හැරීම ඇතුළුව ECL ආදර්ශවල ප්‍රධාන උපකල්පනවලට අභියෝග කිරීම සහ කළමනාකරණයේ ප්‍රධාන විනිශ්චයන් සහ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම;
- පද්ධති සහ ECL ආදර්ශ සඳහා දත්ත යෙදවුම්වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය පරීක්ෂා කිරීම සහ ඉදිරි දැක්මේ අවස්ථා සඳහා යොදා ගන්නා ආර්ථික තොරතුරු සහ ඒවාට අදාළ බර තැබීමට අභියෝග කිරීම;
- පැහැරහැරීමේ සම්භාවිතාව සහ අලාභ දෙන පැහැර හැරීම වැනි ආකෘතිවල භාවිතා කරන ප්‍රධාන උපකල්පන භාවිතා කරමින් නියැදි පදනම මත ECL නැවත ගණනය කිරීම;
- පවතින අවිනිශ්චිත සහ වෙනස්වන සාර්ව ආර්ථික පරිසරය සහ කොවිඩ්-19 වසංගතයේ ගම්‍යාර්ථ පිළිබඳ සමාගමේ ප්‍රතිෂ්ඨාවන්වල සාධාරණත්වය තක්සේරු කිරීම;
- අදියරකරණය, පැහැරහැරීමේ සම්භාවිතාව සහ අලාභ දෙන පැහැර හැරීම ඇතුළුව ECL ආදර්ශ කළමනාකරණ ගණනය කිරීම සහ උපකල්පන ලෙස ඉදිරිය දකින සාධක ඇතුළත් කිරීමේ යෝග්‍යතාවය සහ ECL ආදර්ශයට කළමනාකරණ ආවරණය තක්සේරු කිරීම සඳහා අපගේ අභ්‍යන්තර උපදේශන විශේෂඥයින් සමඟ වැඩ කිරීම;
- අදාළ ගිණුම්කරණ ප්‍රමිති අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල සිදු කරන ලද අනාවරණයන්හි ප්‍රමාණාත්මතාව තක්සේරු කිරීම.

**වෙනත් තොරතුරු**

අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී. මෙම මූල්‍ය ප්‍රකාශනවල අනෙකුත් තොරතුරු ඇතුළත් නොවේ.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර එහි අන්තර්ගතය පිළිබඳව කිසිදු සහතික කරන අදහසක් අපි ප්‍රකාශ නොකරමු.

**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යයයි කළමනාකරණය තීරණය කරන අභ්‍යන්තර පාලනයන් සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වා ගෙන යාමේ සමාගමේ හැකියාව තක්සේරු කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම්, හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

**මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ අපගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම අපගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයක කොටසක් ලෙස, අපි විසින් විගණනය තුළ වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කළ අතර වෘත්තීය සැක මුසු බව පවත්වා ගනු ලැබිය. තවද;

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගෙන හා තක්සේරු කර, එම අවදානම්වලට ප්‍රතිචාරාත්මකව විගණන පටිපාටි සැලසුම් කර ඉටු කරමින් අපගේ විගණනය සඳහා පදනමක් ලබා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගනිමි. වංචාවකින් ඇතිවන වැදගත් සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සොයා නොගැනීමේ අවදානම දෝෂයෙන් සිදුවන බලපෑමට වඩා ඉහළ වන අතර, වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, වංචාව දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට සම්බන්ධවන බැවිනි.
- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබගන්නා ලද නමුත්, සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අපි අදහස් නොකරමු.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ අදාළ හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගැයීමට ලක් කළෙමු.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට අපි නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට අපගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් අපගේ මතය විකරණය කළ යුතුය. අපගේ නිගමනයන් අපගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගෙන ඇති විගණන සාක්ෂිය මත පදනම් වේ. කෙසේවුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළු මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර සාධාරණ ඉදිරිපත් කිරීම අත්කරගත් ආකාරයෙන් එයට පාදක වූ ගනුදෙනු සහ සිද්ධීන් මූල්‍ය ප්‍රකාශනවල නියෝජනය කරන බව අගයන ලදී.

අපගේ විගණනය තුළ වෙනත් කරුණු අතර අප හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ කිසියම් සැලකියයුතු දුර්වලතා ඇතුළුව, විගණනයේ සැලසුම්ගත විෂයපථය සහ කාලසීමාව සහ සැලකියයුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් අපි පාලනය සම්බන්ධයෙන් වගකීමට බැඳී ඇති අය සමඟ සන්නිවේදනය කරන්නෙමු.

අපි ස්වාධීනත්වය සම්බන්ධ ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ආචාරධර්ම අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කර ඇති බවට සහ අපගේ ස්වාධීනත්වය මත සාධාරණ ලෙස සිතිය හැකි සියලු සබඳතා සහ වෙනත් කරුණු ඔවුන් සමඟ සන්නිවේදනය කිරීමට ප්‍රකාශයක් පාලනය සම්බන්ධයෙන් වගකීමට බැඳී ඇති අයට ලබා දෙන්නෙමු.

පාලනය සම්බන්ධයෙන් වගකීමට බැඳී ඇති අය සමඟ සන්නිවේදනය කළ කරුණුවල සිට, පවත්නා කාලසීමාවේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණනය තුළ වඩාත් වැදගත් වූ කරුණු එම නිසාම ප්‍රධාන විගණන කරුණු බව අපි තීරණය කරමු. අපි මෙම කරුණු අපගේ විගණක වාර්තාවේ විස්තර කරන්නේ නීතිය හෝ රෙගුලාසි මගින් එම කාරණය පිළිබඳ ප්‍රසිද්ධ අනාවරණ කිරීම වළක්වන්නේ නම් හෝ අතිශය දුර්ලභ අවස්ථාවන්හිදී, අපගේ වාර්තාවේ යම් කරුණක් සන්නිවේදනය නොකළ යුතු යැයි අපි තීරණය කරන්නේ එසේ කිරීමෙන් අහිතකර ප්‍රතිවිපාක සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි බැවිනි.

**වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය අනුව, විගණනය සඳහා අවශ්‍ය වූ සියලුම තොරතුරු මෙන්ම අපි ලබා ගත් අතර අපගේ පරීක්ෂණයෙන් පෙනෙන පරිදි, විධිමත් ගිණුම්කරණ වාර්තා සමාගම විසින් තබා ගෙන ඇත. කෙසේවෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කළ 2017 අංක 02 දරන අවම ප්‍රධාන ප්‍රාග්ධන නියෝගයේ අවශ්‍යතා 2022 මාර්තු 31 දිනට සමාගම ඉටු කර නොමැත.

මෙම ස්වාධීන විගණකගේ වාර්තාව සඳහා වගකියන සහභාගිත්ව හවුල්කරුගේ සාමාජිකත්ව අංකය 2599 වේ.

KPMG

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
කොළඹ
2022 ජූනි 30


KPMG, a Sri Lankan Partnership and a member firm of the KPMG global organization of independent member firms affiliated with KPMG International Limited, a private English company limited by guarantee.

P.Y.S. Perera FCA
W.J.C. Perera FCA
W.K.D.C Abeyrathne FCA
R.M.D.B. Rajapakse FCA
M.N.M. Shameel FCA
Ms. P.M.K.Sumanasekara FCA
C.P. Jayatilake FCA
Ms. S. Joseph FCA
S.T.D.L. Perera FCA
Ms. B.K.D.T.N. Rodrigo FCA
Ms. C.T.K.N. Perera ACA
T.J.S. Rajakarier FCA
Ms. S.M.B. Jayasekara FCA
G.A.U. Karunaratne FCA
R.H. Rajan FCA
A.M.R.P. Alahakoon ACA

Principals - S.R.I. Perera FCMA(UK), LLB, Attorney-at-Law, H.S. Goonewardene ACA, W.A.A. Weerasekara CFA, ACMA, MRICS


www.skillsads.com